# සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය

# අයදුම්පත් කැඳවීම

සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතියේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 07/2025 චක්‍ර ලේඛනය අනුව සුදුසුකම් සපුරා ඇති දැනට සමිතියේ සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන්ගෙන් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2025-11-14 සිට 2025-12-05 දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් යොමු කරන ලෙසත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කර **"ගරු සභාපති, සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය, රිකිල්ලගස්කඩ"** යන ලිපිනයට එවිය යුතුය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා ඒ සමඟ අදාළ සහතිකවල ඡායා පිටපත් එවිය යුතු අතර, එසේ පිටපත් නොමැතිව, සුදුසුකම් සනාථ නොවන අයදුම්පත් හා නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ සහතිකවල ඡායා පිටපත් සමඟ මෑතකදී ගත් චරිත සහතික දෙකක් සහ පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයද, වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් සහ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්ද එවිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට සියළුම සහතිකපත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

දැනට විවිධ සේවා සමුපකාර සමිතියක සේවය කරන අයෙකු අයදුම්කරන්නේ නම් එම සමිතියේ මෑතක දී ගත් සේවා සහතිකයේ පිටපත් ඉදිරිපත් කළයුතු අතර, අයදුම්පත සමිතියේ සභාපති තුමා මගින් නිර්දේශ කර එවිය යුතුය.

**ලේකම් - III**

**පුරප්පාඩු තනතුරු - 01**

- ➢ වැ: පැ: අ :- E.L - 03:03
- ➢ වැ.ප :- 37,680 - 605X10 - 910X10 - 1,210X10 = 64,930/-
- ➢ වයස් සීමාව :- 18-45
- ➢ සුදුසුකම් :-

අ සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරි තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු -1 තනතුරක වසර 05 ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 07 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/කළමනාකරු 2 තනතුරක /ගිණුම් සහකාර 1 තනතුරක වසර 08 ක ස්ථාවර සේවා පළපුරුද්දක් තිබීම/ කළමනාකරු 3 තනතුරක / ගිණුම් සහකාර 2 තනතුරක වසර 9 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම

**හෝ**

ඇ පිළිගත් ආයතනයක මාස 09 ට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය / ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාව සමත්වීම/සමුපකාර උසස් පෙළ සමත්වීම සමඟ සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු -1 තනතුරක/පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 2 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/කළමනාකරු 2 තනතුරක/ගිණුම් සහකාර -1 තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම./ කළමනාකරු 3 තනතුරක/ගිණුම් සහකාර 2 තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**ගිණුම් සහකාර 1 - III**

**පුරප්පාඩු තනතුරු - 07**

- ➢ වැ: පැ: අ :- T.L - 09:01
- ➢ වැ.ප :- 31,800 - 490X10 - 740X10 - 985X10 = 53,950/-
- ➢ වයස් සීමාව :- 18-45
- ➢ සුදුසුකම් :-

අ කළමනාකරු 3 (ස.ණ.ස සමිති/වෙනත් මූල්‍ය ආයතන) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම./ ගිණුම් සහකාර 2/ ක්ෂේත්‍ර නිලධාරි (ව්‍යා/බැංකු) 2 තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/වෙළඳසැල් කළමනාකරු තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/පරිඝනක ක්‍රියාකරු/යතුරු ලේඛක තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 04 සමත් වීම (පැරණි නිර්දේශය)/ අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03 ක් සමත් වීම (නව නිර්දේශය) හෝ සමුපකාර උසස් පෙළ සමත් වීම.(අ.පෙ.ස (උසස් පෙළ) විභාගයෙන් (පැරණි නිර්දේශය/ නව නිර්දේශය) වාණිජ අංශයෙන් සමත් වී තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.)

**හෝ**

ඇ අ.පො.ස (සාමාන්‍ය පෙළ) අංක ගණිතය/වාණිජ/ගණිතය හා සිංහල භාෂාව ඇතුළු විෂයයන් 03 කට සම්මාන සහිත දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම/සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම.

**ක්ෂේත්‍ර නිලධාරි (ව්‍යාපෘති/ බැංකු) 1 - III**

**පුරප්පාඩු තනතුරු - 04**

- ➢ වැ:පැ:අ :- T.L - 09:02
- ➢ වැ.ප :- 31,800 - 490X10 - 740X10 - 985X10 = 53,950/-
- ➢ වයස් සීමාව :- 18-45
- ➢ සුදුසුකම් :-

අ කළමනාකරු 3 (ස.ණ.ස සමිති/වෙනත් මූල්‍ය ආයතන) තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම./ ක්ෂේත්‍ර නිලධාරී (ව්‍යා/ බැංකු) 2 තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම. වෙළඳසැල් කළමනාකරු තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/පිළිගත් ආයතනයක ක්ෂේත්‍ර නිලධාරි ලෙස වසර 01 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ අ.පො.ස (උසස් පෙළ) විෂයයන් 04 කින් (පැරණි නිර්දේශය)එකවර සමත් වීම/ අ.පො.ස (උසස් පෙළ) විෂයයන් 03 කින් ( නව නිර්දේශය) එකවර සමත් වීම /සමුපකාර උසස් පෙළ සමත් වීම.

**හෝ**

ඇ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළු විෂයයන් 03 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම./සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම.

**වෙළඳසැල් කළමනාකරු (කෝප් සිටි) - III**

**පුරප්පාඩු තනතුරු - 01**

- ➢ වැ:පැ:අ :- T.L - 09:03
- ➢ වැ.ප :- 31,800 - 490X10 - 740X10 - 985X10 = 53,950/-
- ➢ වයස් සීමාව :- 18-45
- ➢ සුදුසුකම් :-

අ වෙළඳසැල් කළමනාකරු තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ වෙනත් සමුපකාර සමිතියක ව්‍යාපාරික අංශයේ කළමනාකරුවකු ලෙස වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ කාර්යාල කාර්යය සහායක/වෙළඳ සහයක ලෙස වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ආ අ.පො.ස (උසස් පෙළ) විෂයයන් 04 කින් (පැරණි නිර්දේශය) එකවර සමත් වීම/ අ.පො.ස (උසස් පෙළ) විෂයයන් 03 කින් එකවර සමත් වීම (නව නිර්දේශය)/ සමුපකාර උසස් පෙළ සමත් වීම.

**හෝ**

ඇ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ගණිතය ඇතුළු විෂයයන් 06 කින් එකවර සමත් වීම.

**ආරක්ෂක නිළධාරි - III**

**පුරප්පාඩු තනතුරු - 01**

- ➢ වැ:පැ:අ :- P.L - 13:04
- ➢ වැ.ප :- 30,000 - 455X10 - 685X10 - 910X10 = 50,500/-
- ➢ වයස් සීමාව :- 18-45
- ➢ සුදුසුකම් :-

අ අටවන ශ්‍රේණිය සමත් වීම (අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්විය යුතුය)

**ගරු සභාපති,**
**සී/ස රිකිල්ලගස්කඩ විවිධ සේවා සමුපකාර සමිතිය, රිකිල්ලගස්කඩ.**
**දු. අ 0812365580**
**2025-11-06**